# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,225 - 2021 අප්‍රේල් මස 23 වැනි සිකුරාදා - 2021.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 333 |

*සැ. යු.-* ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2021 අප්‍රේල් මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 මැයි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

329- B 082224 — 353 (2021/04)
D 1 -

# විවිධ දැන්වීම්

## රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

කුමාර වෙල්ගම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ ''රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* ගෘහ කර්මාන්ත සහ ස්වයං රැකියා නියුක්තිය සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම ;

*(ආ)* මාර්ග සංවර්ධන සහ නිවාස යෝජනා ක්‍රම, ආරෝග්‍යශාලා, ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම වැනි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

*(ඇ)* ළමයින්ගේ, කාන්තාවන්ගේ හා අනාථ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ගෘහ සුබ සාධක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, වීදි දරුවන් රැක බලා ගැනීම,

යනාදිය වේ.

කුමාර වෙල්ගම,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කළුතර දිස්ත්‍රික්කය.

04-603

---

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

### ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය,

මාලඹේ, තලාහේන, අරලිය පෙදෙසේ, අංක 3 ඩී දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි (ලියාපදිංචි අංක PV99468 දරන) අයි. එම්. බේස්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC 24/2021CO
ස්වභාවය : සමාගම්
කාර්යපටිපාටිය : ලඝු

1. නඩරාජා චන්ද්‍රමෝහන්,
2. සියුලින් කාඕ,

*දෙදෙනාගේම ලිපිනය :*

අංක 3/2, විජය, මාවත, තලාහේන, මාලඹේ.

*..........................පෙත්සම්කරුවන්.*

මාලඹේ, තලාහේන, අරලිය පෙදෙසේ, අංක 3 ඩී දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අයි. එම්. බේස්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV99468) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2021 මාර්තු මස 16 දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම 2021 ජූලි මස 22 වැනි දිනට නියම කරන ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස තම අදහස වෙනුවෙන් එකී විමසීම් කරන අවස්ථාවේදී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥ තැනගෙන් ඉල්ලා සිටි විට ලබා ගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ,*

නීතිඥ සංජේ ෆොන්සේකා මයා,
අංක 171, බෝපිටිය, පමුණුගම.

*සටහන* - මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සංජේ ෆොන්සේකා මහතා වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර, 2021.07.21 වන දින පස්වරු 4.00 ට පෙර බාර දිය යුතු ය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥ තැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

04-831

---

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

### ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය,

මාලඹේ, තලාහේන, අරලිය පෙදෙසේ, අංක 3 ඩී දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි (ලියාපදිංචි අංක PV103746 දරන) එක්ස්ක්ලුසිව් කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC 23/2021CO
ස්වභාවය : සමාගම්
කාර්යපටිපාටිය : ලඝු

1. නඩරාජා චන්ද්‍රමෝහන්,
2. සියුලින් කාඕ,

*දෙදෙනාගේම ලිපිනය :*

අංක 3/2, විජය මාවත, තලාහේන, මාලඹේ.

.........................*පෙත්සම්කරුවන්.*

මාලඹේ, තලාහේන, අරලිය පෙදෙසේ, අංක 3 ඩී දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි එක්ස්ක්ලුසිව් කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (PV103746) ගණන් බේරා වසා දැමීම සඳහා 2021 මාර්තු 16 දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම 2021 අගෝස්තු මස 02 වන දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥ තැනගෙන් ඉල්ලා සිටි විට ලබා ගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ,*

නීතිඥ සංජේ ෆොන්සේකා මයා,
අංක 171, බෝපිටිය, පමුණුගම.

*සටහන.*- මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සංජේ ෆොන්සේකා මහතා වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම, සහ ලිපිනය ද සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර, 2021.08.01 වන දින පස්වරු 4.00ට පෙර බාර දිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥ තැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

04-832

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය,

මාලඹේ, තලාහේන, අරලිය පෙදෙසේ, අංක 3 ඩී දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි (ලියාපදිංචි අංක PV103681 - දරන) අයි එම් සර්විසස් යාඩ් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC 25/2021 CO
ස්වභාවය : සමාගම්
කාර්යපටිපාටිය : ලඝු

1. නඩරාජා චන්ද්‍රමෝහන්,
2. සියුලින් කාඹ්,

*දෙදෙනාගේම ලිපිනය :*

අංක 3/2, විජය මාවත, තලාහේන, මාලඹේ.

*..............................පෙත්සම්කරුවන්.*

මාලඹේ, තලාහේන, අරලිය පෙදෙසේ, අංක 3 ඩි දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අයි එම් සර්විසස් යාඩ් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (PV103681) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2021 මාර්තු මස 16 වැනි දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම 2021 අගෝස්තු මස 02 වැනි දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේදී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥ තැනගෙන් ඉල්ලා සිටි විට ලබා ගත හැකි බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ,*

නීතිඥ සංජේ ෆොන්සේකා මයා,
අංක 171, බෝපිටිය, පමුණුගම.

***සටහන.***- මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සංජේ ෆොන්සේකා මහතා වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද, දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර 2021.08.01 වන දින පස්වරු 4.00 ට පෙර බාර දිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥ තැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

04-833

---

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය,

කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත අංක 279 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි (ලියාපදිංචි අංක PV104103 දරන) අයි එම් ඒ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC 26/2021CO
ස්වභාවය : සමාගම්
කාර්යපටිපාටිය : ලඝු

නඩරාජා චන්ද්‍රමෝහන්,
අංක 3/2, විජය මාවත,
තලාහේන, මාලඹේ,

*..........................පෙත්සම්කරු.*

කොළඹ 09 දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත අංක 279 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අයි එම් ඒ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (PV104103) ගණන් බේරා වසා දැමීම සඳහා 2021 මාර්තු මස 16 වන දින පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම 2021 ජූලි මස 22 වැනි දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේදී, පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥ තැනගෙන් ඉල්ලා සිට විට ලබා ගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ,*

නීතිඥ සංජේ ෆොන්සේකා මයා,
අංක 171, බෝපිටිය, පමුණුගම.

***සටහන.***- මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සංජේ ෆොන්සේකා මහතා වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද, දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර, 2021.07.21 වන දින පස්වරු 4.00 ට පෙර බාර දිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥ තැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

04-834

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.